ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2013 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 ஜூலி
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2013

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01 වුවමනා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
1. මූලික තෘෂ්ණාවන් ඉටුකර ගැනීම සඳහා මිනිසා තුළ ඇති පෙළඹීමේ ස්වභාවයයි.
2. අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූපයි.
3. ජිවිතය පවත්වා ගැනීමට අත්‍යවශ්‍යයෙන් සපුරා ගතයුතු දෑය.
4. මිනිසාට ජිවත් විමට නැතිවම බැරි දෑ ය.

02. නිෂ්පාදනය වර්ගීකරණයේ දී කාර්මික නිෂ්පාදනයට ඇතුළත් වන්නේ,
1. කෘෂි කර්මාන්තය  2. ධීවර කර්මාන්තය
3. පතල් හා කැණීම්  4. දැව හා වන

03. බෙදාහැරීමේ ක්‍රියාවලිය නිවැරදිව දක්වා ඇත්තේ,
1. නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → පාරිභෝගිකයා
2. තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
3. නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → නියෝජිතයා → පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

04. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග සිදුවූ අවාසියකි.
1. පණිවිඩ ඉතා සුළු කාලයක දී සන්නිවේදනය කළහැකි විම.
2. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් සිදුවන වංචාවන් ඉහල යාම.
3. සාමාන්‍ය වෙළෙඳ පොල වෙනුවට ඉලෙක්ට්‍රොනික වෙළෙඳ පොල බිහිවිම.
4. මහා පරිමාණ කර්මාන්තශාලා බිහිවිම.

05. පහත දෑ අතුරින් ව්‍යාපාරයක ශක්තීන් ලෙස හඳුනා ගත හැක්කේ
1. හොඳ මුල්‍ය හැකියාව හා දුර්වල නායකත්වය
2. කළමණාකරණ නොහැකියාව හා දක්ෂ සේවකයින්
3. දැක්මක් තිබීම හා තීරණ ගැනීමේ දුර්වලතා
4. හොඳ සැලැස්මක් හා ඉදිරි දැක්මක් තිබීම

06. පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධානයක් නොවන්නේ,
1. දෙපාර්තමේන්තු  2. සමුපකාර  3. සංස්ථා  4. රාජ්‍ය සමාගම්

07. ලාභ අරමුණුකර ගත් ව්‍යාපාර සංවිධානයකි.
1. සංස්ථාපිත සමාගම්  2. දෙපාර්තමේන්තු
3. සමිති  4. සමුපකාර

08. හවුල් ව්‍යාපාරයක අවාසියක් ලෙස දැකිය හැක්කේ,
1. විවිධ හැකියාවන් ඇති පුද්ගල පිරිසකගේ එකතුවකි.
2. අන්‍යෝන්‍ය වගකීමට බැඳි සිටීම
3. පහසුවෙන් ආරම්භ කළ හැකි විම
4. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි විම

09. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් නොවනුයේ,
1. අළෙවි සැලැස්ම  2. ආදායම් ප්‍රකාශය
3. මෙහෙයුම් සැලැස්ම  4. මුල්‍ය සැලැස්ම


10. පහත දක්වා ඇත්තේ ව්‍යාපාර කිහිපයක් සහ ඒවා ආරම්භ කිරීමට බලපත්‍ර ලබා ගතයුතු ආයතනයන් ය. එයින් නොගැලපෙන පිලිතුර වන්නේ,
   1. බේකරි - සෞඛ්‍ය අමාත්‍යාංශය
   2. කර්මාන්ත ශාලා - මධ්‍යම පරිසර අධිකාරිය
   3. වාණිජ බැංකු - ශ්‍රී ලංකා මහ බැංකුව
   4. බෙහෙත් ද්‍රව්‍ය අළෙවි ආයතන - සෞඛ්‍ය අමාත්‍යාංශය

11. ව්‍යාපාරයකට මානව සම්පත අනිකුත් සම්පත් අතර විශේෂ වන්නේ,
   1. පහසුවෙන් පාලනය කළ හැකි වීම
   2. නිර්මාණශීලි වීම
   3. ඉක්මනින් ප්‍රතික්‍රියා නොදැක්වීම
   4. පුහුණුව තුළින් සංවර්ධනය කල නොහැකිවීම.

12. භාණ්ඩයක පිරිවැය ගණනය කිරීම සඳහා ව්‍යාපාරයකට වැදගත් වන්නේ,
   1. විකුණුම් මිල තිරණය කිරීම සඳහා
   2. වෙළෙඳ පොල ඉල්ලුම තිරණය කිරීමට
   3. ප්‍රචාරණය කල යුතුද නැද්ද තිරණය කිරීමට
   4. නිෂ්පදන ඒකක ගණන තිරණය කිරීමට

13. ව්‍යාපාරයක මුළු පිරිවැය සමන්විත වනුයේ,
   1. සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, සෘජු වෙනත් පිරිවැය යනාදියෙන්
   2. වක්‍ර පිරිවැය හා පොදුකාර්ය පිරිවැය එකතුවෙනි.
   3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, වෙනත් පිරිවැය ආදියෙනි.
   4. සෘජු පිරිවැය හා වක්‍ර ද්‍රව්‍ය පිරිවැයෙනි.

14. පහත රේඛණ අතරින් පැවරිය නොහැකි රේඛණය වනුයේ,




(1) (2) (3) (4)

15. තැන්පතු භාර ගන්නා ආයතනයකි.
   1. වණික් බැංකු
   2. මූල්‍ය සමාගම්
   3. කල්බදු සමාගම්
   4. මුදල් තැවිකාර ආයතන.

16. රක්ෂණය කළ හැකි අවදානම් වලට අයත් වනුයේ,
   1. ක්ෂයවීම්, වාෂ්පවීම, යල්පැනීම
   2. ඉදිරි ව්‍යාපාරික අලාභ
   3. වැරදි කලමණාකරණ තිරණ නිසා වන අලාභ
   4. සුනාමි අනතුරු මගින් සිදුවන හානි.

17. සන්නිවේදන ක්‍රියාවලිය නිවැරදිව දක්වා ඇත්තේ,

   1. යවන්නා ⟶ පණිවිඩය ⟶ ලබන්නා
   2. යවන්නා ⟶ පණිවිඩය ⟶ මාධ්‍යය ⟶ ලබන්නා
      ↑ ⟵ ප්‍රතිචාරය ⟵ ප්‍රතිපෝෂණය ⟵ ┘
   3. යවන්නා ⟶ පණිවිඩය ⟶ මාධ්‍යය ⟶ ලබන්නා
      ↑ ⟵ ප්‍රතිපෝෂණය ⟵ ප්‍රතිචාරය ⟵ ┘
   4. යවන්නා ⟶ මාධ්‍යය ⟶ පණිවිඩය ⟶ ලබන්නා
      ↑ ⟵ ප්‍රතිපෝෂණය ⟵ ප්‍රතිචාරය ⟵ ┘

18. උපකාරක සේවාවක් ලෙස ප්‍රවාහනය වැදගත් වනුයේ,
   1. නිෂ්පාදන පිරිවැය ඉහල යාම
   2. නිෂ්පාදිත කලට වේලාවට වෙළෙඳපොලට ප්‍රවාහනය කිරීම
   3. මහ පරිමාණ නිෂ්පාදන අධෛර්යමත් වීම
   4. වෙළෙඳ පොල ප්‍රසාරණය නොවීම.

19. ප්‍රවාහනයේ මූලිකාංගයක් නොවනුයේ,
   1. මාර්ගය
   2. මාධ්‍යය
   3. පර්යන්තය
   4. වේගය

20. ගබඩාකරණය යහපත් ලෙස පවත්වාගෙන යාමෙන් ලැබිය හැකි වාසියකි.
   1. පිරිවැය ඉහල යාම
   2. භාණ්ඩ ඉක්මනින් නශ්‍ය වීම
   3. ඉල්ලුම හා සැපයුම සමතුලිතව පවත්වා ගත හැකි වීම.
   4. ආයතනයේ කීර්තිනාමය පලුදු වීම.

21. ජංගම ගිණුම් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයාට ලැබෙන විශේෂ වාසියකි.
   1. ඉහල පොලියකට හිමිකම් කිව හැකි වීම
   2. අයිරා පහසුකම් ලැබීම
   3. බැංකු ගාස්තු අය කිරීම
   4. ප්‍රේශණ රැස්කර ගත නොහැකිවීම

22. ව්‍යාපාරික වගකීමක ලක්‍ෂණයක් වනුයේ,
    1. බැඳීම් නිරවුල් කිරීමේ දී ව්‍යාපාරයේ ලාභ පිටතට ඇදී යාම.
    2. අදාල ගෙවීම ප්‍රමාණය මැනිය නොහැකි වීම
    3. අනාගත ගනුදෙනුවක් තුලින් බිහි විය යුතු වීම
    4. අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ලැබීම.

23. ජංගම වගකීමක් ලෙස හඳුනාගත හැක්කේ,
    1. ඉදිරියට ගෙවූ දුරකථන බිල
    2. කලින් ලද පොලී ආදායම
    3. බැංකු ණය
    4. ව්‍යාපාරික ගොඩනැගිල්ල

24. වත්කමක් වැඩිවීම හා හිමිකමක් වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,
    1. රු. 2,500 විදුලිබිල ගෙවීම
    2. ණයහිමියෙකුට රු. 5,000ක් ගෙවීම.
    3. රු. 2,000ට ගත් භාණ්ඩ රු. 3,000කට විකිණීම
    4. රු. 2,500ක බැංකු ණයක් ලබා ගැනීම

25. පෙරේරාට රු. 5000ක බඩු ණයට විකිණීමේදී 10% ක වෙළෙඳ වට්ටමක් ලබා දී ඇත. මාසයක් ඇතුළත මුදල් ගෙවීම නිසා 5% ක මුදල් වට්ටමක් ද ඔහුට හිමි විය. පෙරේරා ණය පියවීමට ගෙවූ මුදල් වනුයේ,
    1. රු. 4,250
    2. රු. 4,275
    3. රු. 3,500
    4. රු. 4,500

26. මුදල් පොතක ප්‍රති සටහන් යනු,
    1. ව්‍යාපාරයක නිකුත් කළ චෙක්පතක් අගරු වූ විට සටහන් කිරීමය.
    2. මුදල් පොතක බැර කරන ඕනෑම සටහනක් වෙනත් ඕනෑම ගිණුමක හර කරන බවයි.
    3. යම් ගනුදෙනුවක ද්විත්ව ස්වරූපයම එනම් හර හා බැර සටහන් දෙකම මුදල් පොතේ සටහන් කරන අවස්ථාවයි.
    4. ව්‍යාපාරය විසින් බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වූ විට එය බැංකු තීරුව බැර කිරීමයි.

27. පහත ගනුදෙනු අතරින් ප්‍රති සටහනක් වනුයේ,
    1. චෙක්පතකින් පිරිවැටුම් බදු ගෙව්වා රු. 7,000
    2. ණයට භාණ්ඩ විකුණුම් රු. 25,000
    3. ණයගැතියෙකුගෙනන් ලැබුණු රු. 3,500ක චෙක්පත බැංකුවේ තැන්පත් කළා.
    4. ණයහිමියෙකුට රු. 5,000ක මුදල් ගෙවීමෙන් රු. 500ක වට්ටමක් ලැබුණා.

❖ සමනල ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ 2012.12.31 දිනට හර ශේෂය රු. 9,600 කි. බැංකු ප්‍රකාශණයේ ශේෂය මුදල් පොත හා සම නොවිය. එයට පහත හේතු හඳුනා ගන්නා ලදි.
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකල චෙක්පත් රු. 4,000
  - බැංකුවේ තැන්පත් කර ඇති නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 8,000
  - බැංකු ගාස්තු රු. 500
  - සෘජු ප්‍රේෂණ රු. 3,500

28. 2012.12.31 දිනනට මුදල් පොතේ නිවැරදි ශේෂය
    1. රු. 6,600
    2. රු. 12,600
    3. රු. 5,600
    4. රු. 9,100

29. 2012.12.31 දිනට බැංකු ප්‍රකාශයේ පෙන්නුම් කල ශේෂය
    1. රු. 5,600
    2. රු. 12,600
    3. රු. 16,600
    4. රු. 8,600

30. ණයහිමියන්ට නිකුත් කළ චෙක්පතක් අගරුවීමේ දි ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන වනුයේ,
    1. අගරු වූ චෙක් ගිණුම හර<br>බැංකු තීරුව බැර
    2. ණයහිමි ගිණුම හර<br>බැංකු තීරුව බැර
    3. බැංකු තීරුව හර<br>ණයහිමි ගිණුම බැර
    4. බැංකු තීරුව හර<br>මුදල් තීරුව බැර

31. රු. 250ක ගෙවීමක් මුදල් පොතේ ලැබීමක් ලෙස සටහන් කර ඇති අතර, එය නිවැරදිව ණයහිමි ගිණුමේ සටහන් කර ඇත. මෙයින් සිදුවනුයේ,
    1. ශේෂ පිරික්සුම රු. 250කින් තුලනය නොවීම.
    2. ශේෂ පිරික්සුම රු. 500කින් තුලනය නොවීම
    3. ශේෂ පිරික්සුම රු. 500කින් තුලනය නොවීම හා ණයහිමි ගිණුම රු. 500 කින් වැඩියෙන් දැක්වීම.
    4. ශේෂ පිරික්සුම රු. 500කින් තුලනය නොවීම හා මුදල් ශේෂය රු. 500ක් වැඩියෙන් දැක්වීම.

32. මුදල් පොතේ කාර්යයක් වනුයේ,
    1. මූලික සටහන් පොතක් ලෙස කටයුතු කිරීම
    2. ගනුදෙනු පියවීමේ පොතක් ලෙස කටයුතු කිරීම.
    3. උපයෝගි පොතක් හා ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම.
    4. ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම.

33. පහත දැක්වනුයේ මූලික පොත් හා ඒවාට අදාල මූලාශ්‍ර ලේඛණයි. වැරදි පිළිතුර තෝරන්න.
    1. මුදල් පොත - ලදුපත (ලැබීම්)
    2. ආපසු එවුම් ජ'නලය - හර පත
    3. ගැණුම් ජ'නලය - ගැණුම් ඉන්වොයිසිය.
    4. පොදු ජ'නලය - ජ'නල් වවුචරය.

34. පහත සඳහන් ගනුදෙනු අතරින් මුදල් පොතේ සටහන් නොකරනුයේ,
    1. මුදලින් රු. 2,000 ක් ගෙවා ණයහිමියකුගෙන් නිදහස් වීම
    2. අමරාට රු. 500 ක් වටිනා භාණ්ඩ විකිණීම
    3. අත්පිට ගැණුම් රු. 4,500
    4. අයිතිකරු ප්‍රාග්ධනය යෙදුවා රු. 50,000

35. ශේෂ පිරික්සුමකින් හෙලිදරව් වන දෝෂය වනුයේ,
    1. මූලධර්ම දෝෂය
    2. හිලව් දෝෂය
    3. අතිරික්ත දෝෂය
    4. ද්විකරණ දෝෂය

36. පහත ගනුදෙනු අතරින් මූලධර්ම දෝෂයට නිදසුනක් වන්නේ,
    1. රු. 10,000 ක ගැණුම් ඉන්වොයිසිය පොත්වල දෙවරක් සටහන් වීම.
    2. රක්ෂණ ගිණුමට රු. 1,000 ක් අඩුවෙන් ද විදුලිය ගිණුමට රු. 1,000 ක් වැඩියෙන් ද සටහන් කිරීම.
    3. නිමල් විසින් ආපසු එවූ රු. 2,000ක භාණ්ඩ පොත් වල සටහන් කිරීම මගහැරී ඇත.
    4. රු. 5,000ක බැංකු ණය පොලිය, වැරදීමකින් බැංකු ණය ගිණුමට හර කිරීම.

37. පහත වැරදි අතරින් ශේෂ පිරික්සුමක් මගින් හෙලිවන ගනුදෙනුව වන්නේ,
    1. සුනිමල් ට විකුණූ රු. 450ක් වටිනා භාණ්ඩ ගිණුම් පොත්වලින් මග හැරී ඇත.
    2. නයනාගෙන් ණයට ගත් රු. 1,000 ක භාණ්ඩ නයනාගේ ගිණුම රු. 10,000ක් ලෙස සටහන් වීම හා සමන්ගෙන් ගත් රු. 10,000ක භාණ්ඩ සමන් ගිණුමේ රු. 1,000 ක් ලෙස සටහන් වීම.
    3. විදුලි බිල රු. 1,500ක් ගෙවීම මුදල් පොතේ දෙවරක් සටහන් වීම.
    4. වරිපනම් ගෙවීම රු. 500 දුරකථන වියදම් ගිණුමට බැර කර තිබීම.

38. පහත ගනුදෙනු අතරින් මුදල් පොතේ සටහන් නොකල යුත්තේ,
    1. කොමිස් ගෙවීම රු. 10,500
    2. අයිතිකරු විසින් කල භාණ්ඩ ගැනිලි රු. 5,000
    3. ණයගැතියෙකුගෙන් මුදල් ලැබුණු රු. 3,500, දුන් වට්ටම රු. 500
    4. සමන්ගෙන් මුදලට භාණ්ඩ ගැනුම් රු. 20,000

39. මධුර විසින් රු. 12,500 ක් ලෙස මිල ලකුණු කළ භාණ්ඩ 5%ක වට්ටමක් සහිතව සහන් ට ණයට වික්කා. එම භාණ්ඩ වලින් 20% ක් සහන් ආපසු එව්වා. මෙම ආපසු එවූ භාණ්ඩ පොත්වල සටහන් කළ යුත්තේ,

    1. ආපසු එවුම් ගිණුම  හර  රු. 2,500
       සහන් ගිණුම  බැර  රු. 2,500

    2. සහන් ගිණුම  හර  රු. 2,500
       ආපසු එවුම් ගිණුම  බැර  රු. 2,500

    3. ආපසු එවුම් ගිණුම  හර  රු. 2,375
       සහන් ගිණුම  බැර  රු. 2,375

    4. ආපසු එවුම් ගිණුම  හර  රු. 2,500
       සහන් ගිණුම  බැර  රු. 2,375
       දුන් වට්ටම් ගිණුම  බැර  රු. 125

40. ප්‍රධාන ලෙජරයන් 3 වනුයේ,
    1. පොදු ලෙජරය, ණයගැති ලෙජරය, ගැණුම් ලෙජරය.
    2. ණයගැති ලෙජරය, ණයහිමි ලෙජරය, ගැණුම් ලෙජරය..
    3. ගැනුම් ලෙජරය, ණයහිමි ලෙජරය, පොදු ලෙජරය
    4. පොදු ලෙජරය, විකුණුම් ලෙජරය, ණයගැති ලෙජරය.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර විසින් සම්පාදිත යි.